Amãna Bank

## වෙළඳ සේවා

වෙළඳ සේවා නිෂ්පාදන පොලී රහිත වන අතර, සාධාරණත්ව මූලධර්මවලට අනුව ව්‍යුහගත කර ඇත. සිය වාර්ගිකත්වය නොසළකා සියලුම සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ඒවා ලබාගත හැකිය.

නිරන්තර ශාරියා විගණනයන්ට යටත්ව, සියලුම නිෂ්පාදන ශාරියා අධීක්ෂණ කවුන්සිලය විසින් අනුමත කර ඇති අතර, ඒවා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කෙරේ.

### ආනයන

- ලේඛණගත ණය (Sight & Usance) යටතේ ආනයන
- එකතුකිරීම (DP &DA) යටතේ ආනයන
- ආනයන මූල්‍ය
- නැව්ගත කිරීමේ ඇපකර

### අපනයන

- එකතුකිරීම (DP &DA) යටතේ ආනයන
- ලේඛණගත ණය(Sight & Usance) යටතේ ආනයන

### ඇපකර

- සාමාන්‍ය ඇපකර
- රේගු බැඳුම්කර
- ලංසු තැබීමේ බැඳුම්කර
- කාර්යසාධන ඇපකර
- අත්තිකාරම් ගෙවීම් ඇපකර

### වෙනත්

- වෙළඳාම හා සම්බන්ධ වෙනත් මෙහෙයුම්

### ආනයන මුරාබහා (පිරිවැය සහ ලාභ ප්‍රමාණය)

මුරාබහා යන්නෙන් අදහස් වන්නේ, පිරිවැයට නිශ්චිත ලාභයක් එකතුකර යම් නිශ්චිත වෙළඳ භාණ්ඩයක් සැපයීමට අලෙවිකරු ගැණුම්කරු සමග එකඟතාවයකට පැමිණ භාණ්ඩ විකිණීමයි.

### මූලික නීතිරීති

මුරාබහා යනු පොලී මත ලබාදෙන ණය මුදලක් නොවන අතර, එය භාණ්ඩ විකිණීමකි. එබැවින් වලංගු ඉස්ලාමීය විකිණීමකට අවශ්‍ය වන සියලුම කොන්දේසි එයින් සැපිරිය යුතු වේ. විකිණීමේ ගිවිසුම සම්බන්ධයෙන් බොහෝ නීතිරීති පවතින නමුත් ඕනෑම වලංගු විකිණීමක් සිදුකිරීම සඳහා පහත දැක්වෙන නීතිරීති ඉතා වැදගත් වේ.

1. විකුණන අවස්ථාවේදී භාණ්ඩය පැවතිය යුතුය.
2. අලෙවි කරන අවස්ථාවේදී භාණ්ඩ අලෙවිකරුගේ හිමිකාරීත්වයේ පැවතිය යුතුය.
3. අලෙවි කරන අවස්ථාවේදී භාණ්ඩ අලෙවිකරුගේ භෞතික හෝ අනුමිත සන්තකයේ පැවතිය යුතුය.
4. විකිණීම වහාම සහ සම්පූර්ණයෙන් සිදුවිය යුතුය.

එබැවින් අමානා බැංකුව විසින් පළමුව භාණ්ඩ මිලදී ගෙන, එහි අනුමිත සන්තකය ලබාගෙන ඉන්පසු එය ගණුදෙනුකරුට විකුණයි.

### ඇපකර/ අතිරේක ඇප

අමානා බැංකුවේ නිරාවරණය ආවරණය කිරීමට ගණුදෙනුකරු විසින් ප්‍රමාණවත් ඇපකර/ අතිරේක ඇප සැපයිය යුතුය.

**විශේෂ ලක්ෂණ**

- වත්කම් මත මූල්‍ය සැපයීම
- පාරදෘශ්‍ය ස්ථාවර මිලගණන්
- භාණ්ඩ මිලදීගැනීමේදී හා විකිණීමේදී අමානා බැංකුව විසින් සම්පූර්ණ හිමිකාරීත්වය හා අවදානම භාරගනියි.
- ශාරියා ක්‍රමයට අනුකූලයි
- සැඟවුණු පිරිවැය නැත
- සැකසුම් ගාස්තු නැත
- පොලී අනුපාත උච්චාවචන අවදානමක් නැත

**ආනයන මුසවම්මා (විශාල ප්‍රමාණයේ මූල්‍ය සැපයීම්)**

මුසවම්මා යනු සරළ විකිණීමේ ගණුදෙනුවක් වන අතර, අලෙවිකරු සිය පිරිවැය හෙළිකිරීමෙන් තොරව සිය භාණ්ඩ විකුණයි.

**මූල්‍ය සැපයුම් ආකෘතියක් ලෙස මුසවම්මා ක්‍රමය**

අමානා බැංකුව මෙම නිෂ්පාදන පිරිනමන්නේ පහත හේතු මත එයට භාණ්ඩවල අතිරේක පිරිවැය ගණනය කිරීමට නොහැකි වන විට ය.

(අ) නැව්ගත කිරීමේ ලේඛන ලැබීමට පෙරාතුව නැව්භාණ්ඩ ලඟාවීම.

(ආ) සැපයුම්කරුට සත්‍ය ගෙවීම අනාගත දිනයක ගෙවන අවස්ථාවකදී භාවිතය /පිළිගැනීම

මුසවම්මා යනු විශාල මුදලකට විකිණීමට ඉඩ සලසන මූල්‍යකරණ ක්‍රමවේදයක් වන අතර, එයින් වරායේ සිට ගනුදෙනුකරුගේ ගබඩාවට භාණ්ඩ නිශ්කාශනයට පහසුකම් සැලසේ.

**ඇපකර ලිපිය (ධමාන්)**

ධමාන් යනු ණයකරුවෙකු, සැපයුම්කරුවෙකු, හෝ කොන්ත්‍රාත්කරුවෙකු විසින් සැපිරිය යුතුවන යම් අයැදුමක්, ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙක් ඇප වන ගිවිසුමකි. ණයකරුවා, සැපයුම්කරුවා හෝ කොන්ත්‍රාත්කරුවා සිය බැඳීම ඉටුකිරීමට අසමත් වන අවස්ථාවකදී ඇපකරු එම බැඳීම ඉටුකිරීමට වගකිව යුතුය.

**ගාස්තු මත පදනම් වූ සේවාවන් (වකාලා)**

වකාලා යටතට ගැනෙන වෙළඳ සේවාවන්හි මූලික සංකල්පය වන්නේ, එක් පුද්ගලයකුගේ කාර්‍යයක් ඉටුකිරීම සඳහා තවත් පුද්ගලයකු පෙනී සිටින අතර එම ගණුදෙනුව සිදුකිරීමට ඔහු වගකීමෙන් බැඳේ. මෙහිදී පාරිභෝගිකයා මූලික වන අතර බැංකුව නියෝජිතයා වශයෙන් කටයුතු කරයි. ගණුදෙනුවේ සම්පූර්ණ වටිනාකම පාරිභෝගිකයා විසින් දරනු ලබන අතර බැංකුව කිසිඳු මූල්‍යමය පහසුකමක් සපයනු නොලබයි. නමුත් බැංකුව විසින් ලබාදුන් සේවාව වෙනුවෙන් ගාස්තුවක් අය කෙරෙනු ලැබේ. මෙය සියලුම වෙළඳ සේවාවන් සඳහා අදාළ වේ.

## අදහස් සහ පැමිණිලි

අමානා බැංකුව, පාරිභෝගික ඔබගේ අදහස් සහ යෝජනා අගය කොට සලකයි. එබැවින් ඔබගේ අදහස්, ශාඛාවේ ඇති "**ඔබ ලද සේවා අත්දැකීම පිළිබඳව අපට කියන්න**" පෝරමය පිරවීමෙන් හෝ එම පෝරමය අප වෙබ් අඩවියෙන් බාගත කොට පිරවීමෙන් අප වෙත යොමු කරන්න.
මීට අමතරව, අප සේවාව පිළිබඳ ඔබගේ අදහස් සහ පැමිණිලි ඔබට පහත ආකාරයන්ගෙන් අප වෙත යොමු කළ හැක.

- අදාළ ශාඛාවේ කළමණාකාර මහතා හමුවීමෙන්
- ඔබගේ පැමිණිලි feedback@amana.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන්
- අපගේ ක්ෂණික ඇමතුම් අංක 011 7 756756 ඔස්සේ අප ඇමතීමෙන්
- අපගේ වෙබ් අඩවියේ ඇති, සම්බන්ධ වන්න පිටුවෙහි ඔබගේ පැමිණිලි සටහන් කිරීමෙන්

ඔබගේ පැමිණිල්ල ලද විගස එය ලැබූ බවට සනාථ කරමින්, ඒ පිළිබඳව ඉදිරියේදී ගනු ලබන පියවරයන් සම්බන්ධයෙන් අප ඔබව දැනුවත් කර සිටිමු.